සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 8 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ........................................................................................ විභාග අංකය :- ..........................

**සැලකිය යුතුයි:**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(01) අපට ශුද්ධ වූ ත්‍රිත්වය පිළිබඳ අභිරහස වටහා ගත හැකිවන්නේ,
(1) විශ්වාසය තුළිනි. (2) දේව ප්‍රේමය තුළිනි.
(3) දේව වචනය තුළිනි. (4) බලාපොරොත්තුව තුළිනි.

(02) දේව දරුවන් වූ අප .......................... පමණක් වන්දනා කළ යුතුය.
(1) පුත්‍රයාණන් වහන්සේට (2) ත්‍රිත්වික දෙවියන් වහන්සේට
(3) ශුද්ධාත්මයාණන් වහන්සේට (4) ශුද්ධවන්තයන්ට

(03) දෙවියන් වහන්සේගේ ශ්‍රී නාමය ගෞරවයෙන් භාවිත කළ යුතු බව අපට පෙන්වා දෙනුයේ,
(1) පස්වන දේව පනත මගිනි. (2) හතරවන දේව පනත මගිනි.
(3) දෙවන දේව පනත මගිනි. (4) තුන්වන දේව පනත මගිනි.

(04) 'දින හයක් තුළ වැඩ කළ හැක. එහෙත් හත්වන දින සමිඳාණන්වහන්සේ වන මට වෙන් කළ නිවාඩුවේ සබත් දිනයයි.' මෙම ශුද්ධ ලියවිලි පාඨය ඇතුළත් වන්නේ,
(1) උත්පත්ති පොතෙහි ය. (2) ලෙවී ව්‍යවස්ථාවෙහි ය.
(3) ද්විතීය නීති සංග්‍රහයෙහි ය. (4) නික්මයාම පොතෙහි ය.

(05) තම ජීවිත කාලයම දෙවියන් වහන්සේ වෙනුවෙන් ජීවත් වී උන්වහන්සේට සාක්ෂි දරමින් මෙලොවින් සමුගත් අය හැඳින්වෙන්නේ,
(1) සාන්තුවරුන් යනුවෙනි. (2) දිවැසිවරුන් යනුවෙනි.
(3) පූජකවරුන් යනුවෙනි. (4) සභා පියවරුන් යනුවෙනි.

(06) අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහය යනු,
(1) මුල් කිතුනු සංඝයයි. (2) ශුද්ධ වූ සභාවයි.
(3) වතිකාන රාජ්‍යයයි. (4) ස්වර්ග රාජ්‍යයයි.

(07) A - රූප වන්දනාව
B - මිථ්‍යා ඇදහිලි
C - සොරකම් කිරීම
D - ජීවිත විනාශ කිරීම

ඉහත කරුණු අධ්‍යයනය කරන්න. එයින් පළමුවන දේව පනතට විරුද්ධ ක්‍රියාවන් දක්වෙන්නේ,
(1) A සහ C මගිනි. (2) B සහ D මගිනි.
(3) A සහ B මගිනි. (4) A සහ D මගිනි.

Department of Education – Western Province

(08) 'මම ඔබට කියමි. කොහෙත්ම නොදිවුරන්න.' (මතෙව් 5 : 34 - 37) මෙම ශුද්ධ ලියවිලි පාඨය අනුව දිවුරුම තරයේ ම හෙළා දකින්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේ ය.
(2) ශුද්ධ වූ පාවුළු තුමා ය.
(3) ශුද්ධ වූ පේදුරු තුමා ය.
(4) ශුද්ධ වූ ජාකොබ් තුමා ය.

(09) දිව්‍ය පූජා යාගය තුළ පූර්ණ ලෙස සමරනු ලබන්නේ,

(1) ක්‍රිස්තුන් වහන්සේගේ මාංශගතවීමේ අභිරහස ය.
(2) ක්‍රිස්තුන් වහන්සේගේ පාස්කු අභිරසයි.
(3) ක්‍රිස්තුන් වහන්සේගේ ස්වර්ගාරෝහණයයි.
(4) ක්‍රිස්තුන් වහන්සේගේ දෙවන ආගමනයයි.

(10) අති උතුම් xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ජනවන්දනාව පිළිබඳ ප්‍රකාශයට පත් කළ විශ්ව ලේඛනය වනුයේ,

(1) වෙහෙසෙන මිනිස්සු ය.
(2) දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථාකයාණෝ ය.
(3) ලෝක සාමය ය.
(4) ජනතා ප්‍රගතිය ය.

(11) A - එළමුවන දේව ප්‍රකාශය

B - පිළිතුරු ගීය

C - පශ්චාත්තාපිත යැදුම

D - පඬුරු මත යැදුම

ඉහත අක්ෂරවලින් දැක්වෙන්නේ දිව්‍ය පූජාවේ පිළිවෙත්වල අනුකොටස් වේ. ඒවායින් දේව වාක්‍ය පිළිවෙතට අයත් නොවන්නේ,

(1) A සහ B මගිනි.
(2) B සහ D මගිනි.
(3) C සහ D මගිනි.
(4) A සහ C මගිනි.

(12) අප සැම එකට එක්ව පුද කරන දේව වන්දනා පිළිවෙත දෙවියන් වහන්සේට ප්‍රසන්න පඬුරක් ලෙස පුද කරන්නේ,

(1) පූජා ප්‍රසාදි තුමා ය.
(2) ශුද්ධාත්මයාණන් වහන්සේ ය.
(3) ක්‍රිස්තුන් වහන්සේම ය.
(4) රදගුරු ප්‍රසාදීන් වහන්සේ ය.

(13) සැම වසරක් පාසාම පාස්කු භෝජනය පැවැත්වීමේ දී ඊශ්‍රායෙල් ජනතාව නුමුහුන් පූප අනුභව කළේ,

(1) අන්තිම රාත්‍රී භෝජනය සිහි කිරීමට ය.
(2) දේව ජනතාවක් ලෙස වගකීම් ඉටුකිරීමට ය.
(3) දෙවියන් වහන්සේගේ ආඥා පිළිපැදීමට ය.
(4) මිසර දේශයේ වහල්කමින් මිදී පොරොන්දු දේශයට පිටත්වීම සිහි කිරීමට ය.

(14) දේව වචනයට සවන් දිය යුතු ආකාරය පැහැදිලි කෙරෙන ජේසුස් වහන්සේ වදාළ උපමාවක් වන්නේ,

(1) මිදිවැල පිළිබඳ උපමාව ය.
(2) වපුරන්නා පිළිබඳ උපමාව ය.
(3) නැති වූ පුත්‍රයා පිළිබඳ උපමාව ය.
(4) යහපත් සමාරියයා පිළිබඳ උපමාව ය.

Department of Education – Western Province

(15)

| දේව ප්‍රසාද නිධානය | ලැබෙන දීමනා |
|---|---|
| 1. ........................................ | 1. ශුද්ධාත්ම දීමනා වර්ධනය වීම |
| 2. ප්‍රසාද ස්නාපනය | 2. දේව දරුකම |
| 3. ........................................ | 3. ආත්මික පෝෂණය |

ඉහත වගුවේ හිස්තැන් සම්පූර්ණ කිරීමට වඩාත් සුදුසු පිළිතුර වනුයේ,

(1) අභිවෘද්ධි ආලේපය / රෝගීන්ගේ ආලේපය

(2) සමගි සන්ධානය / දිව්‍ය සත්ප්‍රසාදය

(3) අභිවෘද්ධි ආලේපය / දිව්‍ය සත්ප්‍රසාදය

(4) පූජකවරය / රෝගීන්ගේ ආලේපය

(16) A - ආත්මානුභාවය

B - දේවාත්මානුභාවය

C - ශුද්ධාත්මය

D - දේවත්වය

ඉහත කරුණු අතරින් පුරාණ ගිවිසුමෙහි 'ශුද්ධාත්මයාණන් වහන්සේ' යන යෙදුම වෙනුවට භාවිත කර ඇති යෙදුම් වනුයේ,

(1) A, C සහ D ය. (2) B, C සහ D ය.

(3) A, B සහ D ය. (4) A, B සහ C ය.

(17) 'අඳන දෙකක් ඇති අය නැති අයට දෙත්වා, කෑම ඇති අය කෑම නැති අයට දෙත්වා' (ලූක් 3:11) මෙම අනුශාසනය මගින් ස්නාවක ජොහාන් තුමා දෙන පණිවුඩය වන්නේ,

(1) අසරණ අයට පිහිට විය යුතු බවය.

(2) සෑම පුද්ගලයෙකුට ම අඳන දෙකක් අවශ්‍ය වන බව ය.

(3) අප ළඟ අධිකයෙන් ඇති දේ පමණක් බෙදා ගත යුතු බව ය.

(4) අපට අත්‍යවශ්‍යය දේ පවා අන් අය සමඟ බෙදා ගත යුතු බව ය.

(18) ජේසුස් වහන්සේ තම ප්‍රසිද්ධ ජීවිතය ආරම්භ කළේ,

(1) ගලීලයෙනි. (2) බෙත්ලෙහෙමෙනි.

(3) සමාරියෙනි. (4) ජෙරුසලමෙනි.

(19) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ශාරීරික සූදානම යනුවෙන් අදහස් කරන්නේ,

(1) එක්වරු ශීලය රැකීමය.

(2) පාපයෙන් වැළකී සිටීම ය.

(3) දිව්‍ය පූජාව ආරම්භ වීමට පෙර දෙව්මැදුරට පැමිණීම ය.

(4) දිව්‍ය සත්ප්‍රසාදය ලැබීමට පෙර අවම වශයෙන් පැයක්වත් සියලු ආහාර පානවලින් වැළකී නිරාහාරශීලීව සිටීම ය.

(20) කිතුනු දරුවකු ලෙස දෙවිඳුන්ට ප්‍රසන්න ජීවිතයක් ගත කිරීම සඳහා මම

(1) දිව්‍ය පූජාවට සහභාගි වෙමි.

(2) දේව ප්‍රසාද නිධාන ලබා ගනිමි.

(3) සැබෑ වූ එක ම දෙවියන් වහන්සේ තුළ විශ්වාසයේ ජීවිතයක් ගත කරමි.

(4) දේව වචනය මෙනෙහි කරමි.

(ලකුණු 2 x 20 = 40)

Department of Education – Western Province

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමුවන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**
- **පළමුවන ප්‍රශ්නයට ලකුණු 16ක් ද, තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.**

(01) 'දේව පනත් පිළිපදිමු' යන මාතෘකාව යටතේ ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) පළමුවන දේව පනතින් අපට නියම වන්නේ කුමක් ද? (ලකුණු 02)

(2) දෙවන දේව පනතට විරුද්ධ ක්‍රියාවන් දෙකක් ලියන්න. (ලකුණු 04)

(3) ඉරුදිනය ස්වාමින් වහන්සේගේ දිනය ලෙස සැලකීමට හේතු දෙකක් ලියන්න.(ලකුණු 04)

(4) තුන්වන දේව පනත ලියා දක්වන්න. (ලකුණු 02)

(5) දේව පනත් පිළිපැදීමෙන් ඔබගේ අධ්‍යාත්මික ජීවිතයට ලැබෙන මඟපෙන්වීම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 04)

(02) (1) 'නුඹේ දෙවි වන සමිදාණන් වහන්සේට නමස්කාර කරන්න. උන්වහන්සේට පමණක් සේවය කරන්න' මෙම ශුද්ධ ලියවිලි පාඨයෙන් ක්‍රිස්තුන් වහන්සේ අපට දෙන පණිවුඩය කුමක් ද? (ලකුණු 02)

(2) ත්‍රිත්වික දෙවියන් වහන්සේගේ කාර්යයන් වෙන් වෙන්ව ලියන්න. (ලකුණු 03)

(3) සමාජය තුළ පවතින මිථ්‍යා ඇදහිලි තුනක් නම් කර, ඒවා ප්‍රතික්ෂේප කිරීමට ඔබ ක්‍රියා කරන අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

(03) (1) ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානයේ දී ඇති වූ ප්‍රධාන සිදුවීම් තුනක් ලියා දක්වන්න. (ලකුණු 03)

(3) ශුද්ධ වූ ත්‍රිත්වයේ සාංඝික ජීවිතය ඔබගේ පවුල තුළින් ක්‍රියාවට නැංවිය හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 06)

(04) (1) ජේසුස් වහන්සේ දේව රාජ්‍ය පිළිබඳ ඉගැන් වූ උපමා දෙකක් නම් කරන්න. (ලකුණු 0

(2) ජනවන්දනාවේ ප්‍රධාන අංග තුන ලියා දක්වන්න. (ලකුණු 0

(3) ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් 6ක් ලියන්න. (ලකුණු 0

(05) (1) ජේසුස් වහන්සේගේ දේව පුත්‍ර භාවය අනාවරණය වූ අවස්ථාවක් නම් කරන්න.(ලකුණු 02)

(2) නාසරෙත් ධර්ම ශාලාවේ දී ජේසුස් වහන්සේ විසින් කියවන ලද යෙසායාගේ ග්‍රන්ථයේ සඳහන් වූ උන්වහන්සේගේ දූත කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) ඔබට මුහුණ දීමට සිදුවන ජීවිත අභියෝග තුනක් ලියා ඒවා ජයගැනීමට ඔබ ගන්නා ක්‍රියා මාර්ග විස්තර කරන්න. (ලකුණු 06)

Department of Education – Western Province

(06) (1) දිව්‍ය සත්ප්‍රසාදයට පූර්ව සලකුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) එකම දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධතාවය ගොඩ නගා ගැනීමට ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලිය්නන. (ලකුණු 03)

(3) නපුරේ බලවේගවලින් මිදී දෙවිඳුන්ට ප්‍රසන්න දිවියක් ගත කිරීමට අවශ්‍ය ශුද්ධාත්ම වරම් යදිමින් යැදුමක් නිර්මාණය කරන්න. (ලකුණු 06)

(07) (1) 'ස්වාමිවාක් ආරාධනාව' ඇතුළත් වන දිව්‍ය පූජා පිළිවෙත නම් කරන්න. (ලකුණු 02)

(2) සාන්තුවරයන්ට ගෞරව කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

(3) දිව්‍ය පූජාවට අර්ථාන්විතව සහභාගි වීමට ඔබට කළ හැකි කාර්යයන් හයක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

Department of Education – Western Province